පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 08 |

# අවසාන වාර පරීක්ෂණය - 2019
## ක්‍රිස්තියානි ධර්මය

පාසලේ නම : ..........................................................................................
ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම/ඇතුළත්වීමේ අංකය : ..........................................
.............................................................................................................. කාලය : පැය 02 යි.

### I කොටස

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. 'ඉන්පසු දෙවියන් වහන්සේ අපගේ .......... අනුව, අපගේ සමානාත්මතාවය ලෙස මනුෂ්‍යා මවමු.' මෙහි හිස්තැනට සුදුසු පිළිතුර තෝරන්න.
    (1) රූපය (2) ගැලපීම (3) ස්වරූපය

02. මිනිසා දෙවි පියාට අකීකරු වී ගෙඩි කෑවේ,
    (1) ජීවන වෘක්ෂයෙනි. (2) හොඳ නරක අවබෝධ කර ගැනීමෙනි. (3) ඇඳහිල්ලෙනි.

03. ස්ත්‍රිය වූ ඒව රවටනු ලැබුවේ,
    (1) ආදම් ය. (2) දේව පියා ය. (3) සර්පයා ය.

04. කුඩා මෝසෙස්ගේ ජීවිතය බේරා ගැනීමට දේව පියා යොදා ගනු ලැබුවේ,
    (1) පාරාවෝගේ දූ කුමරිය ය. (2) සෙබළුන් ය. (3) පාරාවෝ රජු ය.

05. ඊශ්‍රායෙල් සෙනඟ ගමන් ගත් මුහුද වන්නේ,
    (1) කළු මුහුද ය. (2) ගොළු මුහුද ය. (3) රතු මුහුද ය.

06. දෙවියන් වහන්සේ මනුෂ්‍යාට ප්‍රේම කළ ආකාරය බයිබලයේ සඳහන් වන්නේ,
    (1) අහස තරමට ය. (2) මුහුද තරමට ය. (3) තමාගේ එකම පුත්‍රයා දෙන තරමට ය.

07. ගීතාවලිය රචනා කර ඇත්තේ,
    (1) දාවිත් රජු ය. (2) සාවුල් රජු ය. (3) සාමුවෙල් රජු ය.

08. එඬේරා ලඟ ඇති උපකරණයකි.
    (1) උදැල්ල (2) කසය (3) කෙවිට

09. යහපත් එඬේරාගේ ලක්ෂණයකි.
    (1) වන සතුන්ට බයේ සැඟවීම (2) රැලට පසුපසින් ගමන් කිරීම (3) තුවාල වූ බැටළුවන්ට සුවය සැලසීම

Education NCP - www.edncp.lk

10. පැරණි ගිවිසුමට අයත් පොත් ගණන වන්නේ,

(1) 66 කි. (2) 39 කි. (3) 27 කි.

11. පංච පුස්තකයට කියන තවත් නමකි.

(1) ශුභාරංචිය (2) යැවුම් පත්‍රය (3) ටෝරා

12. ආදි පිතෘවරුන්ගේ කතා පුවත ආරම්භ වන්නේ බයිබලයේ,

(1) උත්පත්ති 12 සිට ය. (2) උත්පත්ති 1-12 දක්වා ය. (3) උත්පත්ති අවසන් කොටසේ ය.

13. ඊසාක්ගේ මව්පියන් වන්නේ,

(1) සෙකරියස් සහ එලිසෙබෙත් ය. (2) ආබ්‍රහම් සහ සාරා ය. (3) රෙබෙකා හා ආබ්‍රහම් ය.

14. විලුඹ ඩැහැගන්නා යන අර්ථය ඇති ආදි පිතෘවරයා වන්නේ,

(1) ඊසාක් ය. (2) ආබ්‍රහම් ය. (3) ජාකොබ් ය.

15. දිවැසිවරයෙක් යනු,

(1) දේව පණිවිඩය ජනතාවට ඉදිරිපත් කරන්නා (2) දේව සභාවේ මූලිකත්වය දරන්නා

(3) ජනතාව වෙනුවෙන් දුක් විඳින්නා

16. ලිප්පිදොත්ගේ බිරිඳ වන්නේ,

(1) දෙබෝරා ය. (2) එලිසෙබෙත් ය. (3) සාරා ය.

17. දෙවියන් වහන්සේ විසින් ඔසවා ගනු ලැබීම යන තේරුම ඇත්තේ,

(1) යෙසායා (2) ජෙරමියා (3) නෙහෙමියා

18. උත්ථාන වූ ජේසුස් වහන්සේගේ ඇණ කැලැල් දැක විශ්වාස කළ ගෝලයා,

(1) පේදුරු ය. (2) තෝමස් ය. (3) ජුදාස් ය.

19. මුල් ගෝලයන් කැඳවනු ලැබුවේ,

(1) ගෙනසෙරෙත් විල අසල දී ය. (2) රතු මුහුද අසල දී ය. (3) මධ්‍යධරනී මුහුද අසල දී ය.

20. දිවැසිවර ජෙරමියා දුටු දර්ශනයක් වන්නේ,

(1) කණකාටු එළදෙනුන් 7 ක් (2) ගොයම් කරල් 7 ක් (3) කලින් පිබිදෙන කොට්ටම්බා ගසක්

(ලකුණු 2X20=40)

Education NCP - www.edncp.lk

## II කොටස

ප්‍රශ්න **හයකට** පමණක් පිළිතුරු සපයන්න.

01. (i) ගෝලයන්ට සුව කළ නොහැකි වූ ජේසුස් වහන්සේ විසින් සුව කළේ කුමන රෝගියෙක් ද? (ලකුණු 02)

(ii) "බිය නොවන්න, ඇදහිල්ලෙන් සිටින්න. ඇය සුව වනු ඇත." මෙහි අවස්ථා සම්බන්ධය ලියන්න. (ලකුණු 03)

(iii) සුවය ලැබීම පිණිස අප තුළ තිබිය යුතු ගුණාංග **දෙකක්** ලියා ඔබට ඇති අසනීපවලට සුවය ඉල්ලා යාච්ඤාවක් ලියන්න. (ලකුණු 05)

02. (i) ශ්‍රී ලාංකික සමාජය ගොඩ නැගීමට ක්‍රියා කළ පියතුමන්ලා **දෙදෙනෙකු** නම් කරන්න. (ලකුණු 02)

(ii) ඔවුන්ගෙන් එක් අයෙකු පිළිබඳ කරුණු **තුනක්** ලියන්න. (ලකුණු 03)

(iii) ඔවුන්ගේ ජීවිතවලින් ඔබගේ ජීවිතයට ගත හැකි ආදර්ශ **පහක්** ලියන්න. (ලකුණු 05)

03. (i) පංච පුස්තකය යනු කුමක්ද? (ලකුණු 02)

(ii) පංච පුස්තකයේ ඇති පොත් නම් කරන්න. (ලකුණු 03)

(iii) දසපනතේ 'නුඹේ මවට ද පියාට ද ගරු කරන්න' යන පනත ආරක්ෂා කිරීමට ඔබට කළ හැකි දේවල් **පහක්** ලියන්න. (ලකුණු 05)

04. (i) ආදි පිතෘවරුන් යනු කවුරුන්ද? (ලකුණු 02)

(ii) ආබ්‍රහම් දෙවියන් වහන්සේගෙන් ලද පොරොන්දු **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(iii) ඊසාක්ගේ ජීවිතයෙන් ඔබගේ ජීවිතයට ගත හැකි ආදර්ශ **පහක්** ලියන්න. (ලකුණු 05)

05. (i) එංගලන්තයේ සිට ශ්‍රී ලංකාවට පැමිණ දුප්පතුන් වෙනුවෙන් සේවය කළේ කවුද? (ලකුණු 02)

(ii) ඇය විසින් ඉටු කළ සේවා **තුනක්** ලියන්න. (ලකුණු 03)

(iii) ශුද්ධාත්ම මඟපෙන්වීම ඇති දරුවකු තුළ තිබිය යුතු ගුණාංග **පහක්** ලියන්න. (ලකුණු 05)

06. (i) ශුද්ධාත්ම දීමනා ශුද්ධාත්මයාණන් වහන්සේ අපට දී ඇත්තේ ඇයි. (ලකුණු 02)

(ii) ශුද්ධාත්ම ඵලයක් වන 'ප්‍රේමය' අර්ථය පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iii) යහපත් එඬේරා වශයෙන් ජේසු තුමාගෙන් ඔබගේ ජීවිතයට ගත හැකි ආදර්ශ **පහක්** ලියන්න. (ලකුණු 05)

07. පහත සඳහන් මාතෘකා **දෙකක්** තෝරා ගෙන ඒ පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) නෙහෙමියා

(ii) දෙබෝරා

(iii) ජෙරමියාගේ කැඳවීම

(ලකුණු 5X2=10)

***

Education NCP - www.edncp.lk

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
08

# අවසාන වාර පරීක්ෂණය - 2019
# ක්‍රිස්තියානි ධර්මය

**පිළිතුරු පත්‍රය**

## I කොටස

01. (3) ස්වරූපය
02. (2) හොඳ නරක අවබෝධ කර ගැනීමෙනි.
03. (3) සර්පයා ය.
04. (1) පාරාවෝගේ දූ කුමරිය ය.
05. (3) රතු මුහුද ය.
06. (3) තමාගේ එකම පුත්‍රයා දෙන තරමට ය.
07. (1) දාවිත් රජු ය.
08. (3) කෙවිට
09. (3) තුවාල වූ බැටළුවන්ට සුවය සැලසීම
10. (2) 39 කි.
11. (3) ටෝරා
12. (1) උත්පත්ති 12 සිට ය.
13. (2) ආබ්‍රහම් සහ සාරා ය.
14. (3) ජාකොබ් ය.
15. (1) දේව පණිවිඩය ජනතාවට ඉදිරිපත් කරන්නා
16. (1) දෙබෝරා ය.
17. (2) ජෙරමියා
18. (2) තෝමස් ය.
19. (1) ගෙනසෙරෙත් විල අසල දී ය.
20. (3) කලින් පිබිදෙන කොට්ටම්බා ගසක්

(ලකුණු 2X20=40)

## II කොටස

01. (i) මීමැසි රෝගී දරුවා (ලකුණු 02)

(ii) කීවේ :- ජේසුස් වහන්සේ
කාටද :- යාහිරස්ට
කොහේද :- ඔහුගේ නිවසේ දී දුව සුවපත් කිරීමට යන අවස්ථාවේ දී (ලකුණු 03)

(iii) විශ්වාසය හා ඇදහිල්ල
යාච්ඤාවට අදාළ පරිදි ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

02. (i) ගරු මයිකල් රොද්‍රිගු පියතුමා/ සේවක සැමුවෙල් සෙල්වරත්නම් පියතුමා (ලකුණු 02)

(ii) 18 පාඩම 81,-83 පිටු බලන්න. (ලකුණු 03)

(iii) 18 පාඩම 81,-83 පිටු බලන්න. (ලකුණු 05)

03. (i) බයිබලයේ මුල් පොත් පහ (ලකුණු 02)

(ii) උප්පත්ති/ නික්මයාම/ ලෙවී ව්‍යවස්ථාව/ ගණන් කතාව/ ද්විතීය නීති සංග්‍රහය (ලකුණු 03)

(iii) 88 පිටුව බලන්න. (ලකුණු 05)

04. (i) දෙවියන් වහන්සේගේ සැලැස්ම ඉදිරියට ගෙනයාමට විවිධාකාරයෙකින් කැඳවනු ලදුව දේව මෙහෙවර මැනවින් ඉටු කළ පුද්ගලයින් (ලකුණු 02)

(ii) ජීවත් වීමට දේශයක්/ මහත් ජාතියක් /ආශිර්වාදිත නමක් (ලකුණු 03)

(iii) 94 පිටුව බලන්න. (ලකුණු 05)

05. (i) ඉව්ලින් කානි මව්තුමිය (ලකුණු 02)

(ii) අනාථ දරුවන් වෙනුවෙන් ප්‍රීති නිවාසය/ අසරණ වැඩිහිටියන් වෙනුවෙන් සන්ධ්‍යා නිවාසය / නංගි ගෙදර නමින් පාසලක්/ සාමයේ නිවාස නමින් රෝහල (ලකුණු 03)

(iii) සුදුසු පරිදි ලකුනු ලබා දෙන්න. (ලකුණු 05)

06. (i) එකිනෙකා දිරි ගන්වමින් කිතුනු සභාව ගොඩ නැංවීමට (ලකුණු 02)

(ii) ඔබේ විරුද්ධවාදීන් ඔබට පීඩා කරන කළ ඔවුන්ට පීඩා කරනු වෙනුවට ඔවුන් පිළිබඳව ඔබට දයාවේ හැඟීමක් හටගන්නේ නම්, පෙරලා යමක් බලාපොරොත්තු නොවී අනුන්ට උපකාර කිරීමට ඇති හැඟීම (ලකුණු 03)

(iii) සුදුසු පරිදි ලකුණු දෙන්න. (ලකුණු 05)

07. 21, 22, 23 පාඩම් බලන්න.

(ලකුණු 5X2=10)

***